

## ලියා දන්වන වග යි

සන්නස මංගල කළාපය දොරට වැඩියේ ඉතාම නිශ්ෂබ්දව ය. සන්නස ගැන එක වචනයක් හෝ නොකියන්නට මෙල්බන් හි බොහෝ සිංහල මාධ්‍ය පරිස්සම් වූ ආකාරය අපූරු ය. එනමුදු ඒ ගැන අපේ අහිතක් නැත. අප පිළිබඳ විශ්වාසය තබන අපේ පාඨකයන් සන්නස පිළිබඳ දැක්වූ යහපත් ප්‍රතිචාරය හා අදහස් උදහස් අපට විශාල ධෛර්යයක් විය. ඒ සියලු දෙනාටම ස්තුති කරන්නට මේ අවස්ථාව යොදා ගන්නෙමු.

අප සන්නස මංගල කලාපයේ කීවා සේ ම අපේ අරමුණු අතර සිංහලෙන් ලියන ශ්‍රී ලංකාවේ හා ඔස්ට්‍රේලියාවේ වෙසෙන ලේඛක ලේඛිකාවනට අත්වැලක් වීම මුල් තැනක තිබෙයි. සන්නස පිළිබඳ ඒ නිර්වචනය නොසෑහෙන බව අපි දනිමු. එබැවින් සන්නස ගැනම තවත් ටිකක් කතා කරන්නට අපට සිදුවෙයි.

සන්නස කිසිම දේශපාලන පක්ෂයකට අයත් නැති කිසිම දේශපාලන පක්ෂයකට ආවඩන්නේ නැති ස්වාධීන මාධ්‍යයකි. වසර තිහකට අධික කාලයක් පුරා පුවත් පත් සමග හාද වී සිටින අපට ස්වාධීන මාධ්‍යයක් ගොඩ නැගීම අරුමයක් හෝ අලුත් කාරියක් හෝ නොවන්නේ ය. මේ තාක් කාලයක් දේශපාලන පක්ෂ වලින් වියුක්තව ජනතාව සමග සිටි අපි ඒ ස්වාධීනත්වයේ වටිනා කම පැහැදිලිව වටහා ගෙන අත්තෙමු.

අපි නිවැරදි දෙයට නිවැරදි යයි කියන්නෙමු. වැරැද්ද වැරැද්දක් ලෙස දකින්නෙමු. කරන්නේ කව්ද යන පැණය අපට වැදගත් නැත.

පැහැදිළි ලෙස ම සන්නස සෑම මතයකටම ඉඩ දෙන විවෘත වේදිකාවක් වනු ඇත. එයින් නිසි ඵල නෙලා ගැනුම ඔබට බාර කාරියකි.

සන්නස බිහිවන්නේ කිසිදු මාධ්‍යයක් සමග තරග කරන්නට නොවේ. අපි අපටම විශේෂිත වූ ගමනක නිරතව සිටින්නෙමු. අපේ ගමන පිළිබඳ නිසි තක්සේරුවක් කරන්නට තවම සන්නස ළදරු වැඩි බව බුද්ධිමත් පාඨකයන් වටහා ගන්නා බව අපි දනිමු.

ඕනෑම මාධ්‍යයක් ගොඩ නැගීම අසීරුය. දුෂ්කරය. අප ඒ දුෂ්කර ගමනේ යෙදුනේ වරක් දෙවරක් නොවේ. නැවත වතාවක් බින්දුවෙන් පටන් ගෙන ඒ ගමන යන්නට අපි අධිෂ්ඨාන කරගෙන සිටිමු. ඒ සඳහා අපට ශක්තියක් ඇත. ඒ ගමනේදී අපට එල්ලවන සාධාරණ විවේචන වලට අපි හිස නමන්නෙමු. ද්වේෂයෙන් එල්ල කරන ගල් මුල් උපේක්ෂාවෙන් විඳ දරා ගන්නෙමු. ඒ සඳහා අප ලබා ඇති පන්නරය ඕනෑ තරම් සෑහෙයි.

**සන්නස සංස්කාරක**

---

# සන්නස SANNASA

උරුමය වෙනුවෙන්


**සංස්කරණය**

ජගත් ජේ එදිරිසිංහ

Jagath J Edirisinghe

**සන්නස පිරිවර**

| | |
|---|---|
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| ආනන්ද කුමාරසිරි | Ananda Kumarasiri |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ

ජගත් ජේ එදිරිසිංහ

Page Layout & Graphic Designs

Jagath J Edirisinghe



සන්නස

PO Box 17

Reservoir

Vic 3073

Tel : 0425 720 932

Fax : 03 9310 4196



සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත


---




සීතල පරිසරයක් ඇති තණ පිටියක සිට කෙළිදෙලෙන් ගත කරන ගෝනුන් දැක ගැනීමට නම් ඔබ යා යුත්තේ හෝර්ටන් තැන්නටයි. ශ්‍රී ලංකාවේ තිබෙන ජාතික වනෝද්‍යාන 12 අතරින් ඉතාමත් සුන්දර සහ වටිනාම ජාතික වනෝද්‍යානය වන්නේ ද හෝර්ටන් තැන්නයි. එමෙන්ම සංචාරකයින්ට පයින් ගමන් කිරීමේ වරම ලබා දී තිබෙන එකම ජාතික වනෝද්‍යානය වන්නේ ද හෝර්ටන් තැන්නයි.

### ගමන් මාර්ග

කඳු සහ නිම්නයන්ගෙන් සැදුම් ලත් සුන්දර හෝර්ටන් තැන්න නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයෝ ප්‍රධාන ගමන් මාර්ග තුනක් උපයෝගී කරගෙන පැමිණෙති. කිලෝමීටර් 32ක් දුරැති නුවරඑළිය, අඹේවෙල සහ පට්ටිපොළ මාර්ගය ද, කිලෝමීටර් 38ක් දුරැති හපුතලේ බොරලන්ද ඔහිය මාර්ගය ද, කිලෝමීටර් 38ක් දුරැති නුවරඑළිය, හක්ගල, රේන්ද පොළ, අඹේවෙල, පට්ටිපොළ මාර්ගය ද ඒ අතර වෙයි. මේ මාර්ග තුන ඔස්සේම වාහන ගමන් කළ හැකි වීම ද විශේෂත්වයකි. මෙයට අමතරව ගවේෂකයන් ගමන් කරන මාර්ග දෙකක් ද තිබේ. බෙලිහුල්ඔය නාගරක් මාර්ගය සහ තලවාකැලේ,

25 වන පිටුවට

## හෝර්ටන් තැන්නේ අසිරිය විඳගමු

නුවරඑළියේ සිට කිලෝමීටර් 32ක් දකුණින් දේශාංශක 60 47’ - 60 50’ සහ අක්ෂාංශ 800 47’ - 800 51’ අතර පිහිටා ඇති හෝර්ටන් තැන්න අතීතයේ දී හඳුන්වන ලද්දේ ‘මහ එළිය’ යන නමිනි. 1831-1837 කාලය තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරවරයා ලෙස සේවය කළ බ්‍රිතාන්‍ය ජාතික ශ්‍රීමත් රොබට් හෝර්ටන් මහතා සිහිවීම සඳහා ‘හෝර්ටන් තැන්න’ නමින් හැඳින් වූ මෙම සුන්දර තැනිතලාව ස්වභාවික රක්ෂිත භූමියක් බවට පත් කරන ලද්දේ 1969 දෙසැම්බර් මස 05 වැනිදායි. හෝර්ටන් තැන්නේ ඇති ජෛව විවිධත්ව සහ සමස්ත පාරිසරික වටිනාකම සැලකිල්ලට ගත් වනජීවී සංස්කරණ දෙපාර්තමේන්තුව 1988 මාර්තු මස 16 වැනි දින එය ජාතික වනෝද්‍යානයක් බවට ද නම් කළේය.

